Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - 20

ශ්‍රේණිය - 13

සකස් කළේ-රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

නිපුණතාව 09 - විදේශ වෙළෙඳාමේ න්‍යායාත්මක පදනම විග්‍රහ කරමින් විදේශ වෙළෙඳාම ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම ගවේෂණය කරයි.

නිපුණතා මට්ටම 9.5 - ශ්‍රී ලංකා විදේශ වෙළෙඳාමේ ස්වභාවය හා විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති විමර්ශනය කරයි.

- කිසියම් රටක් ලෝකයේ වෙනත් රටවලට භාණ්ඩ හා සේවා අලෙවි කිරීම අපනයන වෙළෙඳාමයි.

උදා - ශ්‍රී ලංකාව ඇමරිකා එක්සත් ජනපදයට තේ අලෙවි කිරීම.

ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

1.කෘෂිකාර්මික අපනයන
2.කාර්මික අපනයන
3.ඛනිජ ද්‍රව්‍ය අපනයන
4.වර්ග නොකළ අපනයන

- යම් රටක් ලෝකයේ වෙනත් රටවලින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම ආනයන වෙළෙඳාමයි.

උදා - ශ්‍රී ලංකා ජපානයෙන් වාහන මිලදී ගැනීම.

ශ්‍රී ලංකාවේ ආනයන ව්‍යුහය පහත පරිදි දැක්විය හැකිය.

1.පරිභෝජන භාණ්ඩ
2.අන්තර් භාණ්ඩ
3.ආයෝජන භාණ්ඩ
4.වර්ග නොකළ භාණ්ඩ

1.අපනයන වෙළෙඳාමේදී මුහුණ දෙන ගැටළු මොනවාද?

2.එම ගැටළු විසඳා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?